# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1908/5 - 2015 මාර්තු මස 30 වැනි සඳුදා - 2015.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ රත්නපුර මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

මිය යාම හේතු කොට ගෙන රත්නපුර මහ නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අබේරත්න වික්ටර් කපිල් වික්‍රමනාත් නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත්, ඒ රත්නපුර මහ නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාමයෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

රත්නපුර මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරී මාතර ආච්චිගේ පද්මසිරි චන්ද්‍රවංශ පෙරේරා වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 ඔක්තෝබර් මස 08 දින රත්නපුර මහ නගර සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේදී තෝරා පත්කර ගත් අවසාන සභිකයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබාගත් ගගුල්විටිය ගමගේ හේමන්ත සුදේශ් ගමගේ මහතා ඒ පුරප්පාඩුව ඇති වූ රත්නපුර මහ නගර සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. ඒ. පී. සී. පෙරේරා,
තේරීම් භාර නිලධාරී,
රත්නපුර මහ නගර සභාව.

2015 මාර්තු මස 27 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

04 - 498

1A - G 21323— 17 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.